එක්සත් ජාතික පක්ෂය
ஐக்கிய தேசியக் கட்சி
United National Party

## මාධ්‍ය නිවේදනය

**"රනිල් වික්‍රමසිංහ මහතා ඇති කළ ආර්ථික වර්ධන සැලැස්මෙන් වර්තමාන ආණ්ඩුව ඉවත් වෙලා"** – දිනුක් කොළඹගේ

2022 වසරේ Viii වැනි විධායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ආරම්භ කළ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ සහ ආර්ථික වර්ධනයේ උපායමාර්ගික සැලැස්ම වර්තමාන රජය තවදුරටත් අනුගමනය නොකරයි.

ජාතික ජන බලවේග රජය බලයට පත් වූ මුල් අවධියේදී හිටපු ජනාධිපතිවරයා ආරම්භ කළ ආර්ථික ස්ථායීකරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම දිගටම සිදු කළද, එය ආර්ථික වර්ධන සැලැස්ම සමඟ සමගාමීව ක්‍රියාත්මක කිරීමට ඔවුන් අපොහොසත් වී ඇත.

එම වර්ධන සැලැස්මේ මූලික අරමුණක් වූයේ ශ්‍රී ලංකා රුපියලේ අගය ශක්තිමත් කිරීම සහ උද්ධමනය සියයට 3ට අඩු මට්ටමක පවත්වා ගැනීමයි. නමුත් වර්තමානයේ එය සිදුවන්නේ නැත.

ජාතික ජන බලවේග ආණ්ඩුව බලයට පත්වූ දා සිට ශ්‍රී ලංකා රුපියල තවදුරටත් අවප්‍රමාණය වෙමින් පවතින අතර, උද්ධමනය සියයට 6 ඉක්මවා ගොස් ඇත. ආර්ථිකයට වර්ධනයක් ගෙන එන කිසිදු නව සැලැස්මක් හඳුන්වා දීමටද ආණ්ඩුව අසමත් වී ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ක්‍රියාත්මක වැඩසටහන ආර්ථික ස්ථායීකරණයට පමණක් සීමා වූ, ආර්ථික වර්ධනය සමඟ සම්බන්ධ නොවූ තනි වැඩසටහනක් බවට පත්ව තිබේ.

ආණ්ඩුව පිළිතුරු දිය යුතු මූලික ප්‍රශ්නය වන්නේ, රටේ ණය ආපසු ගෙවීමට මූල්‍යමය වශයෙන් සූදානම් වෙමින්, එකවරම දරිද්‍රතාවය අඩු කරමින්, ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නංවන්නේ කෙසේද යන්නය.

**දිනුක් කොළඹගේ**
කෘත්‍යාධිකාරී මණ්ඩල සභික
එක්සත් ජාතික පක්ෂය
2026 ජූලි 6

**මධ්‍යම කාර්යාංශය** மத்திய பணியகம் **Central Bureau**
"සිරිකොත මන්දිරය", 400, කෝට්ටේ පාර, පිටකෝට්ටේ, ශ්‍රී ලංකාව.
"சிறிகொத இல்லம்", 400 கோட்டே றோட், பிட்டகோட்டே, இலங்கை.
"Sirikottha House", 400, Kotte Road, Pitakotte, Sri Lanka.
Tel: 0112865374 / 0112865375 Fax : 0112865380
E-mail : gnunp@sltnet.lk Web : www.unp.lk

